885

# කුරුණෑගල දිස්ත්‍රිකයේ වාරියපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ව්‍යවහාරික දේශීය දැනුම පිළිබඳ අධ්‍යයනයක්.

ශිෂ්‍ය අංකය : FGS/L/MSSc/2007/010

එම්.එම්.එස්.ඩී. බණ්ඩාර

| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 885 |
| වර්ග අංකය: | |

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ පුස්තකාල හා විඥාපන විද්‍යා සමාජීය විද්‍යාපති උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදී.

2012.

# සාරාංශය

දේශීය දැනුම වත්මන් සමාජය තුළ පුළුල් සංවාදයකට භාජනය වී ඇත. එහෙත් ශ්‍රී ලංකාවේ දේශීය දැනුම පිළිබඳව සිදුකර තිබෙන පර්යේෂණ ඉතා අල්පය. කුරුණෑගල දිස්ත්‍රික්කයේ වාරියපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින් සිදු කරන ලද මෙම අධ්‍යයනයේදී එම ප්‍රදේශයේ ගැමියන්ගේ දේශීය දැනුම් මූලාශ්‍ර හඳුනා ගනිමින් එම දැනුම ඒකරාශි කිරීමටත්, විශේෂයෙන්ම විධිමත් ආකාරයෙන් වාර්තාගත නොවූ දැනුම් කොටස් වාර්තාගත කිරීමටත් මෙමගින් ප්‍රයත්න දරණ ලදී.

වාරියපොල ප්‍රදේශයේ දේශීය දැනුම් පද්ධතිය පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා දේශීය කර්මාන්ත ලෙස කම්මල් කර්මාන්තය, වළං කර්මාන්තය මෙන්ම කෘෂිකර්මාන්තයේ වී වගාව ද අධ්‍යයනයට භාජනය කෙරිණි. දේශීය වෛද්‍ය විද්‍යාව කොටස් 7 ක් යටතේද ප්‍රදේශයට ආවේණික සිරිත් විරිත් හා බැඳුණු දේශීය දැනුම් කොටස් ද විමර්ශනයට ලක්විය. එහිදී එම මූලාශ්‍රවල පැවැත්ම, සංවර්ධනය, සම්ප්‍රේෂණය, එහි සක්‍රීයභාවය සහ දැනුම කළමනාකරණය ආදී කරුණු පිළිබඳ පූර්ණ අධ්‍යනයක් සිදු කරන ලදී.

මෙම අධ්‍යයනය මූලික වශයෙන් ප්‍රාථමික දත්ත මත පදනම් වූ අතර සම්මුඛ සාකච්ඡා ක්‍රමය ප්‍රධාන විය. ද්විතීයික දත්ත රැස් කිරීමේදී උපාධි නිබන්ධන, පර්යේෂණාත්මක ලිපි, අන්තර්ජාලය, විමර්ශන මූලාශ්‍ර ආදිය මගින් දත්ත එක්රැස් කිරීම සිදු කරන ලදී.

දත්ත විශ්ලේෂණය තුළින් හෙළිවුයේ ප්‍රදේශයේ දේශීය දැනුම තවමත් සුරැකී පවතින අතර භාවිතය අවම මට්ටමක පවතින බවය. නවීන විද්‍යාව හා තාක්‍ෂණය යොදා ගෙන සිදු කරනු ලබන මානව ක්‍රියාකාරකම් හේතු කොට ගෙන මෙම ප්‍රදේශය හා බැඳී පවතින දේශීය දැනුම විනාශ මුඛය කරා ඇද වැටෙමින් පවතින බව පෙනේ.